# වාර්තා කල යුතු හැසිරීම් වැඩ සටහන හඳුන්වා දීම

## වාර්තා කල යුතු හැසිරීම් වැඩ සටහන සම්බන්ධව

වික්ටෝරියානු වාර්තා කල යුතු හැසිරීම් වැඩ සටහන මගින් සිය සේවකයන් හෝ ස්වේච්ඡා සේවකයන් සම්බන්ධයෙන් ඇති ළමා අපචාර සහ ළමුන් සම්බන්ධ වැරදි හැසිරීම් සම්බන්ධ චෝදනා සමහර සංවිධාන මගින් ළමුන් සහ තරුණයන් සඳහාවූ කොමිසමට වාර්තා කල යුතුය.

වැඩ සටහන මගින් අරමුණු කරන්නේ සංවිධාන මගින් ළමා අපචාර සහ ළමුන් සම්බන්ධ අයුතු හැසිරීම සම්බන්ධ චෝදනාවලට සංවිධාන මගින් ප්‍රතිචාර දක්වන ආකාරය වැඩි දියුණු කිරීමවේ.

වැඩ සටහන යටතේ:

- සිය සේවකයන් සහ ස්වේච්ඡා සේවකයන්ට එරෙහිව සිදු කරන ළමා අපචාර සහ ළමුන් සම්බන්ධ අයුතු හැසිරීම සම්බන්ධ ෙචාදනාවලට සංවිධාන මගින් ප්‍රතිචාර දැක්විය යුතුය
- සංවිධාන මගින් චෝදනා සම්බන්ධයෙන් කොමිසමට දැනුම් දිය යුතුය
- සංවිධාන මගින් චෝදනාවලට ප්‍රතිචාර දක්වන ආකාරය සහ ඒවා විමර්ශනය කරන ආකාරය කොමිසම මගින් අධීක්ෂණය කරයි
- සංවිධාන, නියාමකයන්, පොලීසිය, ළමුන් සමඟ වැඩ කිරීම සම්බන්ධ පරීක්ෂණ (Working With Children Check) සහ කොමිසම අතර තොරතුරු බෙදා හදා ගැනීම සිදුවේ.

කෙසේ වුවත් අපරාධ ආකාරයේ කිසියම් හැසිරීමක් සංවිධාන මගින් පොලීසියට වාර්තා කල යුතුය. පොලීසිය සම්බන්ධවුවද, පොලීසිය මගින් විමර්ශන ආරම්භ කිරීමට අවසර දුන්පසු, අදල සංවිධානය මගින් විමර්ශන කටයුතු සිදු කල යුතුය.

## වාර්තා කල යුත්තේ කුමන ආකාරයේ හැසිරීම්ද?

- දරුවන් හා සම්බන්ධ වන ලිංගික වැරදි
- දරුවන් හා සම්බන්ධ වන ලිංගික අයුතු හැසිරීම
- දරුවන් හා සම්බන්ධ වන ශාරීරික හිංසන
- දරුවෙකු හට සැලකිය යුතු ආකාරයේ චිත්තවේගී හෝ මානසික හානියක් සිදු කරන කිසියම් හැසිරීමක්
- දරුවෙකුව සැලකිය යුතු ආකාරයට නොසලකා හැරීම.

දරුවෙකු යනු වයස අවුරුදු 18 ට අඩු ඕනෑම අයෙකු ඇතුලත්වේ.

වාර්තා කල යුතු හැසිරීම් ආකාර සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා, කොමිසමේ වෙබ් අඩවියේ වාර්තා කල යුතු හැසිරීම් වැඩ සටහන සම්බන්ධ පුරුක වෙත යන්න.

## වැඩ සටහන අදාල වන්නේ කා හටද?

වැඩ සටහන සමහර සංවිධානවල නිරත වී සිටින පහත පුද්ගලයන් හට අදාල විය හැකිය:

- සේවකයන්
- ස්වේච්ඡා සේවකයන්
- සමහර කොන්ත්‍රාත්කරුවන්
- නිල තනතුරු දරන්නන්
- ආගමික පූජකවරුන්
- ආගමික සංවිධානයක නිලධාරීන්.

ඇතුලත් සංවිධාන සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා, කොමසාරිස්වරයාගේ වෙබ් අඩවියේ සංවිධාන සඳහා වූ පුරුක වෙත යන්න.


03 8601 5281 | contact@ccyp.vic.gov.au | ccyp.vic.gov.au
COMMISSION FOR CHILDREN AND YOUNG PEOPLE

## සංවිධානවල වගකීම් මොනවාද?

වැඩ සටහන යටතේ ඇති වගකීම් ඉටු කිරීමට සංවිධානයක ප්‍රධානියා නීත්‍යානුකූලව බැඳී සිටී. සංවිධානයක ප්‍රධානියා පහත අයෙකු විය හැකිය:

- ප්‍රධාන විධායක නිලධාරී
- සංවිධානයේ ප්‍රධාන නිලධාරියා
- සංවිධානය වික්ටෝරියානු රජයේ දෙපාර්තමේන්තුවක් නම්, ලේකම්

සංවිධානය සතුව ප්‍රධාන විධායක නිලධාරියෙකු, ප්‍රධාන නිලධාරියෙකු හෝ ඒ සමාන අයෙකු නැතිනම්, සංවිධානය විසින් වෙනත් අයෙකු නම් කල හැකිය. මේ සඳහා වන ආකෘතිය කොමිසමේ වෙබ් අඩවියෙ සංවිධානයේ ප්‍රධානියෙකු නම් කිරීම වෙතින් ලබා ගත හැකිය.

සංවිධානයේ ප්‍රධානියා පහත දේ කල යුතුය:

- ළමුන් ආරක්ෂාකාරීව තබා ගැනීමට කටයුතු කිරීම
- සංවිධානය සතුව පැමිණිල්ලක් හෝ චෝදනාවක් ඉදිරිපත් කිරීමට ක්‍රමයක් ඇති බවට වග බලා ගන්න.

සංවිධානයේ ප්‍රධානියා කවරෙකුද යන්න ඔබට පැහැදිලි නැතිනම්, උපකාර සඳහා කොමිසම සමඟ සම්බන්ධ වන්න.

## සංවිධානයේ ප්‍රධානියා විසින් කුමක් කල යුතුද?

| | |
|---|---|
| දැනුම්දීම | චෝදනාව සම්බන්ධයෙන් දැනුවත් වී දින 3 ක් ඇතුලත කොමිසම වෙත දැනුම් දෙන්න. |
| විමර්ශනය | • චෝදනාවක් විමර්ශණය කරන්න<br>• විමර්ශනය කරන්නේ කවුරුන් විසින්ද යන්න කොමිසමට පවසන්න<br>• ළමුන් සම්බන්ධයෙන් අති අවදානම කළමණාකරණය කරන්න. |
| යාවත්කාලීන | චෝදනාව සම්බන්ධයෙන් දැනුවත් වී **දින දර්ශන දින 30 ක්** ඇතුලත කොමිසම වෙත විස්තරාත්මක යාවත්කාලීන කිරීමක් කරන්න. |
| ප්‍රතිඵල | විමර්ශනයේ ප්‍රතිඵලය සම්බන්ධයෙන් කොමිසමට දැනුම් දෙන්න. එසේම සංවිධානය විසින් මීළඟට කිරීමට බලාපොරොත්තු වන දේ සහ එසේ කිරීමට හේතුව දැනුම් දෙන්න. |

සංවිධානයක ප්‍රධානියෙකු **විසින් රාජකාරී දින 3** සහ **දින දර්ශන දින 30** දැනුම් දීමේ රීතීන්ට අනුලව කටයුතු නොකිරීම **අපරාධ වරදකි.**

සංවිධානයක ප්‍රධානියා සතුව ඇති වගකීම් සම්බන්ධ වැඩිදුර විස්තර අපගේ වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

## උපකාර ලබා ගත හැක්කේ කොහින්ද?

ඔබට පහත ආකාරයට  කොමිසම සමඟ සම්බන්ධ විය හැකිය:

- දුරකථනය: (03) 8601 5281
- ඊමේල්: contact@ccyp.vic.gov.au

ඔබට කොමිසමේ වෙබ් අඩවිය වෙතින් වැඩිදුර විස්තර ලබාගත හැකිය: www.ccyp.vic.gov.au

ඔබට භාෂා පරිවර්තකයෙකු අවශ්‍ය නම්, දුරකථන අංක 131 450 ඔස්සේ පරිවර්තන සහ තෝල්ක සේවාව අමතා දුරකථන අංක 03 8601 5281 ඔස්සේ දරුවන් සහ තරුණ අය සඳහාවූ කොමිසම හා සම්බන්ධ කර දෙන ලෙස ඉල්ලා සිටින්න.